# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1418/15 – 2005 නොවැම්බර් 09 වැනි බදාදා – 2005.11.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

දැන්වීමයි

වර්ෂ 2005 ජුලි මස 08 වැනි දින අංක 1400/24 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ නියමයන් ප්‍රකාරව අතිගරු ජනාධිපතිතිය විසින් කැළණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධ කර තිබූ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වර්ෂ 2005 ජුනි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කර 2005 ජුලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි " සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය " නමින් විශ්ව විද්‍යාලයක් පිහිටුවා ඇත.

වර්ෂ 2005 ජුනි මස 30 වැනි දින වන විට කැළණිය විශ්ව විද්‍යාලය මගින් පිරිනැමෙන උපාධි පාඨමාලා සඳහා එකී සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ලියාපදිංචි වී සිටින සියළුම අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 2005 ජුලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය මගින් පිරිනමන උපාධි පාඨමාලා සඳහා නිසි ලෙස ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් ලෙස සලකනු ලබන බව මෙයින් දන්වමි.

තවද, 2003 සහ 2004 වර්ෂයන්හි දී පැවැත් වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාග ප්‍රතිඵල මත සෞන්දර්යය අධ්‍යයන ආයතනයේ උපාධි පාඨමාලා සඳහා අයදුම්කර ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය මගින් පිරිනමන උපාධි පාඨමාලා සඳහා නිසි ලෙස අයදුම්කරන ලද අයදුම්කරුවන් ලෙස සලකනු ලබන බව ද දන්වමි.

තිස්ස නන්දසේන,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,

2005 සැප්තැම්බර් මස 01 වැනි දින,
නො 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

11 – 460


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.